# ශ්‍රී ලංකාව තුළ ආර්ථික, සමාජීය සහ සංස්කෘතික අයිතිවාසිකම් ස්ථාපනය කිරීම උදෙසා බුදු දහමින් ලබාගත හැකි පිටුවහලය

ඩී. සුපුන් රශින්ද ජයවර්ධන[1]


බුදු දහමෙහි මූලික අභිප්‍රාය වන්නේ සකල ලෝක වාසීන්ගේ ආධ්‍යාත්මික විමුක්තිය සාධනය කිරීම උදෙසා වන මාවත පෙන්වාදීමයි. නමුදු එකී ගුණ ධර්ම පිරීමට උචිත සමාජ, ආර්ථික හා සංස්කෘතික වටපිටාවක් රාජ්‍යක් තුල පැවැතීමේ අවශ්‍යතාවයද චක්කවත්තිසීහනාද සූත්‍රය ඇතුළු සූත්‍ර දේශනා ගණනාවක් මඟින් බුදු රජානන් වහන්සේ පෙන්වා දී තිබේ. එම අවශ්‍යතාවයන් අතර ආහාර සෞඛ්‍ය අධ්‍යාපනය මෙන්ම නිවාස අයිතීන්ගේ සුරක්ෂිතතාව ප්‍රමුඛ වන අතර එකී අයිතීන් සෑම පුද්ගලයෙක් විෂයෙහිම සමානව හිමිකර දීමේ වැදගත්කම දසරාජ ධර්මය, සතර සංග්‍රහ වස්තු ආදී හරාත්මක බෞද්ධ සංකල්ප ගණනාවක් ඔස්සේ දක්වා ඇතත් වර්තමාන ශ්‍රීලංකීය නීති දේහය තුල එකී අයිතිවාසිකම් ස්ථාපනය කෙරෙහි යොමුව ඇත්තේ අල්ප වූ අවධානයකි. නමුදු ආර්ථික, සමාජීය සහ සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුතිය මඟින් මූලික මානව අයිතිවාසිකම් ලෙස ඉහතින් සාකච්ඡා කල අයිතිවාසිකම් හඳුනාගනුලබන අතර ඒ අනුව යමින් ලෝකයේ රාජ්‍යයන් බොහොමයක්ම පාහේ ඒවා තම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවන්ට අන්තර් කොට තිබේ. මෙහිදී සිඟාලෝවාද, ව්‍යග්ඝපජ්ජ, පරාභවආදී සූත්‍ර දේශනා ගණනාවක් තුලින් විග්‍රහ කෙරෙන බෞද්ධ ආර්ථික දර්ශනයේ තත්කාලීන වැදගත් කමක් ලෙස තමාට, තම පවුලට සහ රාජ්‍යයට ඉටුකල යුතු මෙන්ම නොකළයුතු දෑ සවිස්තරාත්මකව විග්‍රහ කිරීම පෙන්වාදිය හැකිය. එතුලින් නිර්මාණය වන්නේ නීතියේ සීමාවෙන් ඔබ්බට ගිය සමාජ සම්මත වැඩ පිළිවෙළකි. මේ සියල්ලෙහිම අවසාන අරමුණ ලෙස බුදුදහම අපේක්ෂා කරන්නේ සකල සත්වයාගේ පරම ධනය වන ලෞකික හා ලෝකෝත්තර සන්තුෂ්ටිය උදා කරලීමයි.

ඒ අනුව අධ්‍යයනයේ අරමුණ ලෙස මානවයාගේ භෞතික මෙන්ම ආධ්‍යාත්මික ජීවිතය වඩාත් යහපත් කිරීම පිණිස ආර්ථික, සමාජීය, හා සංස්කෘතික අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමේ වැදගත්කම සාකච්ඡා කිරීමත් ශ්‍රී ලංකාව තුල එකී අයිතීන් ප්‍රතිස්ථාපනය කිරීම සඳහා නීතියේ සීමාවෙන් ඔබ්බට ගොස් බුදුදහමෙන් ලබාගතහැකි උපයෝගීතාවයන් සමාජයේ අවධානයට යොමුකිරීමත් පෙන්වාදිය හැක.

මෙම අධ්‍යයනය සිදු කිරීමේදී මූලික වශයෙන් ක්ෂේත්‍ර අධ්‍යයනයක් ඔස්සේ තොරතුරු ලබාගත් අතර ප්‍රමාණාත්මක සහ ගුණාත්මක ක්‍රමවේදයන් මත පදනම් වෙමින් ප්‍රශ්ණමාලා ක්‍රමය සහ සම්මුඛ පරීක්ෂණ ක්‍රමය ඔස්සේ මහජනතාවගෙන් සහ නීති විද්වතුන්ගෙන් අදහස් ලබාගැනීම සිදුවිය. ඊට අමතරව ද්විතීක මූලාශ්‍රය සපයාග ැනීම කොළඹ විශ්වවිද්‍යාලීය පුස්තකාලය සහ අන්තර්ජාලය මඟින් සිදුකෙරිනි.

ඒ අනුව අධ්‍යයනයේ අවසාන ප්‍රතිපලය ලෙස කතුවරයාගේ මූලික අපේක්ෂාව වන්නේ ශ්‍රී ලංකාව තුල ආර්ථික, සමාජීය සහ සංස්කෘතික අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම පිණිස බුදුදහමේ ආභාසය ලැබූ නෛතික වටපිටාවක් නිර්මාණය කිරීමයි.


**ප්‍රමුඛ පද :** ශ්‍රී ලංකාව, සංස්කෘතික අයිතිවාසිකම

---

1 නීතිවේදී ගෞරව-කොළඹ, සහකාර කථිකාචාර්ය, පොදු හා අන්තර් ජාතික නීති අධ්‍යයන අංශය, නීති පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය
supunkck@gmail'com